


# සැන්දෑ යාමේ

සැන්දෑ යාමේ - එක් වූ යාමේ
මන්දාකිණියේ පෙම් රන් තරුවේ

සන්සුන් වෙරළේ - දෙන්නා රහසේ
ළං වී හිඳිමු - මේ සීමාවේ

මා එදා කියූ සේ
ජීවිතේ පුරා
ආදරේ එසේමයි
නෑ බිඳී ගියේ

වේදනා වියෝවෝ
රෑ දිවා පිරූ
සාගරේ වගේ ම යි
ආදරේ මගේ

මගේ ළයේ නිදන් වූ
ඔබේ සිතුම් පැතුම්
රැඳී සදා තියේවා
මගේ පැතුම් පුරා

*තනුව, සංගීතය සහ*
*ගායනය:* ප්‍රියා සූරියසේන
*රචනය :* ප්‍රේමකීර්ති ද අල්විස්



ආදරයේ චමත්කාරය පිළිබඳ ලියැවෙන, සංගීතවත්ව ගැයෙන ගීත නම් බොහෝමයි. පොපියන යෞවන සිත්වලට වෙනම ම ආගන්තුක හැඟුම් සමුදායක් එක්කරවන ආදරය, යෞවන යෞවනියන් උන්මාදයට පත් කරවීම පුදුමයක් නො වේ. තමන්ට ආදරවන්තයෙකු හෝ ආදරවන්තියක සිටිය ද නො සිටියද, එකී නැවුම් හැඟුම් සමුදායේ නිමග්නව, ඒ අහ්ලාදය විඳින වුන් කාලයෙන් කාලයට නන් වෙසින් ලොව චමත්කාර කරත්. ආදරයක් බලාපොරොත්තුවෙන්, ආදරයේ අරුත් විමසමින් සිටිනා තරුණ තරුණියනට නම් සැබැවින් ම එය ඉතා සුන්දර, මනෝමය අත් දැකීමක්. ආදරයට කෝඩුකාර වූ ඒ මනෝභාවයන් සැබැවින් ම නිර්මලයි. එය අත් විඳින්නට තවමත් සහකරුවෙකු හෝ සහකාරියක් හමු වී නැති ඔවුනට, එකී මනෝභාවයන් සිත් සේ විඳ ගැනීමට කිසිඳු තහංචියක් නැති. එකී සිතුම් පැතුම් වලට කිසිදු සීමාවක් නැති.

ඒ කෙසේ වුව ද, ආදර සබඳතාවයක පැටළුණ මොහොතේ පටන් ම යට කී තත්ත්ව වෙනස් වෙයි. දෙමව්පිය - නෑ හිතවතුන්ගේ අනුමැතිය ලබා ගැනීම, අන් ප්‍රේමාතුර යෞවන යෞවනියන්ගෙන් තමන්ගේ සහකරු හෝ සහකාරිය මුදවාගැනීම, විරුද්ධවාදීන්ගෙන් බේරා ගැනීම වැනි අභියෝග ඕනෑම පෙම් යුවලකට ආගන්තුක නො වේ. සමාජ සම්මත වලට පිටුපානා පෙම්වතුන්ට, පෙම්වතියන්ට මීට අමතරව මුහුණ පෑමට සිදුවෙන අභියෝග මීට වඩා බරපතල විය හැකියි. ඒ කෙතරම් ද යත්, සබඳතාවන් නතර කිරීමට මතු නොව, ජීවිත හානි කරගැනීමට පවා බලපානා තරමේ චිත්ත පීඩා ඇති කරවන සුළු විය හැකියි.

'සමවැදුම' ලිපියට එක්වන 'සැන්දෑ යාමේ' ගීයේ දෙවෙනි අන්තරා කොටස වෙනුවෙනුයි මේ පූර්විකාව ලියැවුණේ. තරුණ ප්‍රේමවන්තයෙකුගේ හෝ විවාහක සැමියෙකුගේ ආත්මීය ප්‍රකාශනයක් සේ ගිණිය හැකි මේ පද රචනාවේ ප්‍රබලම කොටසයි දෙවෙනි අන්තරා කොටස.

''වේදනා වියෝවෝ
රෑ දිවා පිරූ
සාගරේ වගේම යි
ආදරේ මගේ....''

දහවල අවු කාෂ්ඨක වගේ ම, අකුණු ගසා හෙණ හඬ නංවන වර්ෂා රැයේත් දවාලයේත් පුරවාගෙන අත් විඳින සාගරයක් වගේ ය මේ ප්‍රේමවන්තයාට, මේ සැමියාට තමන්ගේ ආදරය. පසු ගිය ප්‍රේමාතීතයේ විඳි වේදනාවන්, වියෝ දුක්, තමන්ට දැනෙන්නේ සයුරක් විඳිනා දුක්ඛ දෝමනස්ස ලෙසින්. ඒ සියල්ල විඳ දරා ගත් ආදරයකි ඔහුගේ ආදරය. කෙනෙකුට මේ දුක් ගැහැට මැද නොසැලී සිටින්නට පන්නරය ලැබෙන්නේත් ඒ අත්දැකීම් නිසා ම යි.

මව් බිමේ සිටි ප්‍රවීණතම ගී පද නිබන්ධකයෙකු වෙන දිවංගත ප්‍රේමකීර්ති ද අල්විසුන්ගේ පද රචනාවකි, 'සැන්දෑ යාමේ'.

පෙම්වතුන්ට රහසින් හමු වී පෙම් බස් තෙපලන්නට, පෙම් රස හව් විඳගන්නට කදිම පරිසරයකි වැටකේ පඳුරුවලින් ගහන සයුරු වෙරළ. සයුර මෙන් නොව, සන්සුන් වූ වෙරළක සිටිනා පෙම්වතාට සිය පෙම්වතිය පෙනෙන්නේ තරු මන්දාකිණියක බැබලෙන රන් තරුවක් ලෙසින්. ඒ වෙරළ සීමාවේ ළං වී හිඳිනා පෙම්වතාගේ මුවින් නිතැතින්ම කියැවෙන පද පෙළකි ප්‍රේමකීර්ති ද අල්විසුන්ට මේ ලියැවී ඇත්තේ.

යටගිය දිනයෙක කියූ සේ ම, පෙම්වතාගේ ජීවිතය පුරාවට ම ඇය පිළිබඳ පහළ වූ ආදරය එලෙසමයි තවමත්. නෑ බඳී ගියේ, ඒ ආදරය. ඒ පළවෙනි අන්තරා කොටසයි.

පෙම්වතාගේ ළයේ නිදන් වී ඇත්තේ ඇයගේ සිතුම් පැතුම් ම යි. ඔහුගේ පැතුම් සම්පූර්ණ වන්නේ ඒ සිතුම් පැතුම් සදා රැඳී ඇති නිසාවෙන්. තුන්වෙනි අන්තරා කොටසක් ලෙසින් එලෙස ලියවී ඇත්තේය නිබන්ධකයාණන්ට.

කෙටි අන්තරා කොටස් තුනක් සහිත මේ පද රචනාව තනුවට අනුව ලියූ රචනාවක්දැයි අනුමානයකි. 'මා එදා' ජීවිතේ 'ආදරේ' 'නෑ බිඳී' වැනි සමාන ලඝු-ගුරු මාත්‍රා සංයුතියකින් යුතු වචන අන්තරා කොටස්වල පද මුලට යෙදී ඇති සැටිය අප ඒ අනුමානයට ගෙන යයි. ඒ නිසා ම ගීය පුරාවට නැංවෙන ශබ්ද රසය තනු රචකයාටත්, ගායන ශිල්පියාටත් මහත් උපකාරයක්. 'සැන්දෑ' 'එක් වූ' , 'මන්දා...' 'දෙන්නා', 'ළං වී' ලෙසින් ස්ථායි කොටස පුරාවටමත් මේ ශබ්ද රසය නැංවීමට ගන්නා ලද උත්සාහය ප්‍රශස්තයි. ප්‍රේමකීර්ති ද අල්විසුන් වැනි ප්‍රවීණයෙකකුට නම් මෙය 'උත්සාහයක්' නො වන්නට ඇති. නිරායාසයෙන්ම ලියවෙන්නට ඇති.

මේ අතිශය සුන්දර, ධ්වනිපූර්ණ ගුණයෙන් අනූන, ගායනීය වදන් පෙළට තනුවක් නිර්මාණය කරගෙන, මියැසි රටාවන්ගෙන් සරසාගෙන ගායනා කරන්නේ දිවයිනේ තවත් එක් ජ්‍යෙෂ්ඨ ප්‍රවීණ ගායන ශිල්පියෙකු වන ප්‍රියා සූරිසේනයන්. තමන්ට ම අවේනික තියුණු හඬක් දායාද කොටගත් ප්‍රියා සූරියසේන ශිල්පියාණන්ගේ මධුර ගායනයත් ගායන ශෛලියත් රසික හදවත් තදින් බැඳගෙන තිබීම පුදුමය එළවන්නක් නොවේ. තාරතාවයෙන් ඉහළ හඬින් විසල් ස්වර පරාසයක ගායන සූරියසේනයන්ගේ හඬපෙර-අපර දෙදිග කුමන මියැසි රටාවකට මුව නො වෙනස්ව සිය දායකත්වය දෙන්නේ ආයාසයකින් තොරව. ගායන ශිල්පියෙකු ලෙසින් පමණක් වැඩි රසික පිරිසක් දැන සිටිය ද තමන් ගයනා සාර්ථක, ජනප්‍රිය ගී රැසකම තනු සහ සංගීත නිර්මාණ කරගෙන ඇත්තේ ප්‍රියා සූරියසේන ශිල්පියා විසින් ම බව දන්නේ සුළුතරයකි.

සැක්සෆෝනය, ගිටාරය සහ සර පුවරුව සංවාදයක් ලෙසින් සංගීත රටාවල හඬවා අපරදිග රටාවට නිර්මාණය කළ සංගීතයක් තමන්ගේ ගායනයටම ගැලපෙන සේ නිර්මාණය කරගත් 'සැන්දෑ යාමේ' තනුවත් ඊට හොඳ නිදසුනක්.



සිසිර දිසානායක